

# ස්වර්ණලතාවෝ

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන් ගැන සලකා බලන කල්හි මධ්‍යම කඳුකරයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයක්. ස්වභාවික සෞන්දර්යයෙන් අනූන මධ්‍යම කඳුකරයෙන්, වියළි කලාපය පෝෂණය කරන ජලධාරා රාශියක් සිය ගමන් මග ආරම්භ කරනවා. මධ්‍යම කඳුකරයේ බොහෝ ප්‍රදේශ පුරා පැතිර පවතින තේ වගාවෙන් මෙරට ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සැපයෙනවා. පළාතේ දේශගුණ විවිධත්වයට ගැලපෙන එලවළු හා පලතුරු වගාවන් ශ්‍රී ලාංකික ජනතාවට අමතර පෝෂණය ලබාදීමේ ප්‍රමුඛයා බවට පත්වී තිබෙනවා. මධ්‍යම කඳුකරයෙන් අඩකඩ වඩා වැඩි ප්‍රදේශයක් අයත් වන්නේ මධ්‍යම පළාතටයි. මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්ක මධ්‍යම පළාත තුළ පිහිටා තිබෙනවා.

මධ්‍යම පළාත් කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ වැඩි වගකීමක් පැවරි ඇත්තේ මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටයි. පළාතේ පරිසරය රැකගනිමින් ගොවි ජනතාවගේ ආදායම් මාර්ග ඉහළ නැංවීම කෙරෙහි නිරතුරුවම අවධානය යොමුකරන කෘෂිකර්ම ව්‍යාපෘති එමගින් හඳුන්වා දී තිබෙනවා.

මෙවර ගොවිකම් සඟරාවේ " වදුල " විශේෂාංගය මඟින් මධ්‍යම පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගොවි මහතුන්ගේ ආදායම් වැඩිකර ගැනීමට අදාලව ක්‍රියාත්මක කෙරුණු එක් වැඩසටහනක් පිළිබඳ හඳුන්වා දීමට බලාපොරොත්තු වේ.

මධ්‍යම පළාතට අයත් මහනුවර දිස්ත්‍රික්කය තුළ දේශගුණ කලාප කිහිපයක් දක්නට ඇති අතර මහනුවර මාරස්සන ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ මැදරට අතරමැදි කලාපීය දේශගුණික ලක්ෂණයි. මෙම ප්‍රදේශය මුහුදු මට්ටමේ සිට උස අඩි 2200 ක් පමණ වන අතර වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1200 පමණ වෙනවා. සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක24 - 30 පමණ වන මෙම ප්‍රදේශයේ යල් කන්නයේ කුඹුරු වලත් මාස් කන්නයේ උස් බිම් වලත් බහුලව සිදු කරන්නේ එළවළු වගාවයි. වී වගාව සිදුකරන්නේ මාස් කන්නයටයි. තක්කාලි වගාව මෙම ප්‍රදේශයේ ගොවීන් අතර ජනප්‍රිය වී තිබෙනවා. බෑවුම් සහිත උස් බිම් වල එළවළු වගා කිරීම නිසා පස සෝදාපාළුවීම ඇතුළු පාරිසරික ගැටළු රාශියක් ඇති වී තිබෙනවා.



මෙම ප්‍රදේශ වල දිගින් දිගටම එළවළු වගා කිරීමෙන් අස්වනු අඩු වීම නිසා අස්වනු වැඩිකර ගැනීමට අධික ලෙස රසායනික පොහොර සහ කෘෂි රසායන භාවිතයටත් ගොවීන් යොමු වී තිබෙනවා. එසේම දේශගුණ වෙනස්වීම්, වෙළඳපල තත්ත්වයන් ආදි හේතු මත එළවළු වගාවෙන් ලැබිය හැකි ලාභය අඩු වීම නිසා පරිසර හිතකාමී, ආදායම් තත්ත්වයද ඉහළ නැංවාගත හැකි විකල්ප බහුවාර්ෂික බෝග හඳුන්වා දීම පිළිබඳ අවධානය යොමු වී තිබෙනවා. මේ සඳහා විකල්පයක් ලෙස වැල්දොඩම් වගාව මෙම ප්‍රදේශ වල හඳුන්වා දී තිබෙනවා.

මධ්‍යම පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් මහනුවර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ මගපෙන්වීම මත මාරස්සන කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ එක් ග්‍රාම නිලධාරි වසමකින් ආරම්භ කළ මෙම වැල් දොඩම් වගාව මාරස්සන ප්‍රදේශයේ සෑම කොටසකම ව්‍යාප්ත වී ගියේ ඉතා කෙටි කාලයක් තුළය. අද වන විට එය තලාතුඔය, ගලහ, මුල්ගම, ගලගෙදර, ගම්පොල, රඹුක්පිටිය ඇතුළු මහනුවර දිස්ත්‍රික්කයේ සෑම කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයකම ව්‍යාප්ත වෙමින් පවතී.

වැල්දොඩම් කිලෝග්‍රෑම් 01 ක් රු. 70 - 120 ත් අතර මිලකට අලෙවි කිරීමට හැකිවීම, වසර හතරක් පමණ වගාව පවත්වාගෙන යාමට හැකිවීම, වසර පුරා අස්වනු ලැබීමට හැකි වීම, පාංශු ඛාදනය වැනි පාරිසරික හානි අඩුවීම, වියලි දේශගුණික තත්ත්ව වලට ඔරොත්තු දීම, වගාවට වැළඳෙන රෝග හා පළිබෝධ අඩුවීම, වගා නඩත්තුව පහසු වීම මෙන්ම මධ්‍යම පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත ප්‍රභේද වල පැළ සහ තාක්ෂණික දැනුම ලබාදීම නිසා වැල්දොඩම් වගාව මෙම ප්‍රදේශ වල සාර්ථකව පැතිරී යාමට හේතු සාධක වී තිබෙනවා.

ඒ අනුව මාරස්සන ප්‍රදේශයේ වැල්දොඩම් වගාව ව්‍යාප්ත කිරීමට මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිරන්තර අවධානය පැවතීම සහ 50% ගොවි දායකත්වය යටතේ ගොවිමහතුන් හට වැල්දොඩම් පැළ ලබාදීමට කටයුතු කිරීමට පියවර ගෙන ඇත. 2006 වසරේ අක්කර එකකින් ආරම්භ කළ වැල්දොඩම් වගාව අද වන විට අක්කර හැත්තෑවක් ඉක්මවා ගොස් තිබෙනවා.

## 2006 වසරේ සිට 2013 වසර දක්වා වැඩසටහනේ ප්‍රගතිය

| වර්ෂය | ප්‍රතිලාභීන් ගණන | පැළ සංඛ්‍යාව | අක්කර ප්‍රමාණය |
|---|---|---|---|
| 2006 | 01 | 400 | 1 |
| 2007 | 03 | 600 | 1.5 |
| 2008 | 03 | 1 000 | 2.5 |
| 2009 | 19 | 5 000 | 12.5 |
| 2010 | 22 | 6 000 | 15 |
| 2011 | 20 | 4 600 | 11.5 |
| 2012 | 19 | 3 100 | 7.75 |
| 2013 | 10 | 2 000 | 5 |



සරුවට වැඩුණු වැල්දොඩම් වගාවක්

තාක්ෂණික උපදෙස් ලබාදී පැළතවාන් ආරම්භ කර ගොවීන්ට අවශ්‍ය පැළ ඔවුන්ටම නිෂ්පාදනය කර ගැනීමට ඉඩ සලස්වමින් මාරස්සන කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ කෘෂිකර්ම උපදේශක ඩී.එම්.කේ. දිසානායක මහතා සිදු කරන මෙහෙය මෙහිදී අගය කළ යුතුයි. මෙම ගමනේදී මාරස්සන ප්‍රදේශයේ වැල්දොඩම් වගාව සම්බන්ධයෙන් ඔහු අප සමඟ මෙසේ පවසා සිටියා.



කෘෂිකර්ම උපදේශක ඩී.එම්. කුසල් දිසානායක මහතා

මෙම ප්‍රදේශයේ ව්‍යාප්ත වන වැල් දොඩම් වගාව මඟින් ගොවීන්ගේ අතමිට සරුවී තිබෙනවා. වැල් දොඩම් මිලදී ගැනිමට පුද්ගලික අංශයේ ආයතන මැදිහත් වී තිබීම මඟින් අලෙවිය සම්බන්ධ ගැටළු අවම වී තිබෙන අතර වැල්දොඩම් කිලෝවක් රු. 70 සිට රු. 120 ත් අතර මුදලකට අලෙවි කිරීමට හැකියාව ලැබී තිබෙනවා. මෙම වැඩසටහන නිසා ස්වකීය ආදායම් තත්ත්වය ඉහළ නැංවී ඇති බව ගොවි මහතුන්ගේද අදහසයි.



එච්.එම්. ආර්.බී. සමරකෝන් මහතා

මේ පිළිබඳ අදහස් දැක්වූ මයිලගහයාය ගොවි සංවිධානයේ එච්. එම්. ආර්. බී. සමරකෝන් මහතා ප්‍රකාශ කළේ දින තුනකට වරක් ගෙඩි නෙලීම සිදුකරන බවත් වසරකට අක්කරයකින් කිලෝ හාරදහසක පමණ අස්වැන්නක් ලබාගැනීමට හැකි වී තිබෙන බවයි. වැල්දොඩම් වගාව අතරතුර අතුරු වගාවක් ලෙස බටු වගා කිරීමෙන් අමතර ආදායමක් ලබා ගැනීමට ඔහුට හැකි වී ඇති බව වැඩිදුරටත් පැවසුවා.

කහඹිලියාව කොටසේ පදිංචි කේ.ජී. වීරකෝන් බණ්ඩා මහතා කියා සිටියේ එක් වැලකින් වසරකට කිලෝ 12 කට වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වූ බවත් අමතර ආදායමක් ලබාගැනීම සඳහා වැල්දොඩම් කොළ මිටියක් මිටියක් රුපියල් 15.00 ක මුදලකට අලෙවිකිරීමට හැකි වීම නිසා එය ඔහුගේ දෛනික වියදම් පිරිමහ ගැනීමට මහත් රුකුලත් වූ බවත්ය.



කේ.ජී. වීරකෝන් බණ්ඩා මයා

මුරපොල ඇල කොටසේ ආර්. ඒ. යූ. ජයරත්න මහතා අක්ෂි දුර්වල තාවයකින් පෙළෙන අතර ඔහු විසින් කරගෙන යන වැල්දොඩම් වගා ක්ෂේත්‍රය ඉතා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම ප්‍රසංශනීයය වන අතර එයින් ඉහළ අදායමක් ලබාගැනීමට ඔහුට හැකි වී තිබෙනවා.


ආර්.ඒ.යූ. ජයරත්න මහතා


බී.ජී. කරුණාදාස මහතා

මුරපොල ඇල කොටසේ බී.ජී. කරුණාදාස මහතා ප්‍රකාශ කළේ වෙනත් බෝග වගාවන් සිදුකිරීමේදී ජල හිඟය බලපාන නිසා තමා වැල්දොඩම් වගාවට යොමු වූ බවයි. වැල්දොඩම් වගාවේදී කාබනික පොහොර යොදාගන්නා බවත් සුපිරි වෙළඳසැල් සමඟ සම්බන්ධ වී අලෙවි කටයුතු කිරීම නිසා හොඳ ආදායමක් ලබාගැනීමට හැකියාව ලැබී තිබෙන බවත් ඔහු ප්‍රකාශ කර සිටියේය.

වැල් දොඩම් වගාවේ නිරත වී සිටින ඒ. ආර්. ඒ. යූ. ජයතිලක මහතා ඔහුගේ අදහස් මෙසේ ප්‍රකාශ කර සිටියා. දැනට වසර කිහිපයකට ඉහතදී කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදෙස් පරිදි වැල්දොඩම් වගාව ආරම්භ කළා. නිර්දේශිත පොහොර සමඟ කාබනික පොහොර ද යොදාගන්නවා. අතුරු වගාවක් ලෙස පැපොල් එළවළු වගා කරනවා. අක්කර 1 1/2 ක භූමි ප්‍රදේශයක වැල්දොඩම් වගාකරල තියනවා. පලතුරු මැස්සා පාලනය සඳහා පෙරමෝන් උගුල් වගාවේ තැන් තැන් වල සවිකරල තියනවා. පලතුරු මැස්සාගේ හානිය එයින් සාර්ථකව පාලනය කරගන්නට හැකිවී තියනවා.


ආර්.ඒ.යූ ජයතිලක මහතා

ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ආදායම් තත්වය ඉහළ නැංවීම සඳහා මධ්‍යම පලාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දුන් මෙම රන්මසු මවන ස්වර්ණලතා වැලක් බඳු වැල්දොඩම් වගා වැඩසටහනට ගොවිකම් සඟරාවේ උණුසුම් සුභපැතුම්.







ගොවිකම් සඟරාවේ අපි